"මම විතරක් නෙවෙයි.. එයත් විඳවනවා.." ඇයට සිතුණි.

ඈ අලුතින් තේ සෑදුවා ය.

"එන්න නිමන්ත තේ බොන්න.." තේ කෝප්පය ද අතැතිව කාමරයේ දොරින් කර පොවා බැලූ ඈ කීවා ය. නිමන්ත ඇය අනුව පහත මාලයට ආවේ ය. කෑම මේසයේ වාඩි වූ ඔහු ඇය දුන් තේ කෝප්පය තොල ගාන්ට වූයේ ය.

ඔහු සියළු දුක්ඛ දෝමනස්සයන් තම සිත තුළ ම සඟවා ගනිමින් ඇය දෙස ආදරයෙන් බලා සිටියේ ය.

"බොන්න.. ඔයා තාම උදේ ට කාලත් නැහැ නේද..?" අමන්දි ඔහු ඉදිරියෙන් වූ පුටුවෙහි වාඩි වූවා ය. ".. මා හින්දා හිත කලබල කරගන්න එපා... අපි එන විදිහකට මුහුණ දෙන්න හිත හදා ගමු.." ඈ කීවා ය.

"අද අපි ලන්ච් එකට කොහේ හරි යමු .." නිමන්ත කතාව වෙනතකට යොමු කරන අටියෙන් කීවේය.

"බෑ නිමන්ත .. ඕනෙ නැහැ.. මට එළියට යන්න හිතක් නැහැ.." අමන්දි කීවා ය.

"එහෙම නෙවෙයි... අද මාත් ගෙදරනේ... අපි ලන්ච් එකත් අරගෙන අම්මලගෙ ගෙවල් පැත්තෙත් ගිහින් එමු .."

එය අමන්දි සතුටට පත් කළ ආරාධනයකි. උදේ පන්සලට යන අතරේදීත් මව බලන්නට යන්නට තිබුණා නම් යැයි තමාට සිතුණ බව ඈ සිහිපත් කළා ය. ඇය වහා ඔහු හා එකඟ වූයේ එබැවිනි.

"එහෙම කරමු.. මටත් අම්මව බලන්න ඕනේ. නංගිත් ඊයෙ උදේ ෆෝන් කරද්දි ඇහුවා එහෙ එන්නෙ නැද්ද කියලා.. " අමන්දි බොහෝ සතුටින් කීවා ය. එසැනින් ඈ කල්පනාවට වැටුණා ය. හිස මේසය මත තබාගත් අමන්දි සිහින් හඬින් ඉකිබින්දා ය. නිමන්ත ඇගේ හිස මත සුරත තැබුවේ ය.

"ඇයි මේ ආයෙම..?" ඔහු පහත් හඬින් ඇසුවේ ය.

"මං.. මං කොහොමද නිමන්ත අම්මලාට මේක කියන්නෙ..?"

000000

නිමන්ත වාහනය පැදෙව්වේ බොහෝ සෙමින් ය. බොරැල්ලට එන තෙක්ම දෙදෙනා අතර කතාවක් නොවී ය. ඔහු වරින් වර හිස හරවා ඇය දෙස බැලූ නමුදු ඈ බොහෝ දුර කල්පනාවකට වැටී සිටියෙන් එයට බාධා කරන්නට නොසිතුවේ ය.

මහගෙදර ගමන ඇගේ සිතට යම් සහනයක් ගෙන දෙනු ඇතැයි ඔහු සිතුවේ ය. එසේ වුවද මේ අසුබ ආරංචිය ඔවුනට හෙළි කරන්නේ කෙසේ ද යන පැනය ද ඔහු සිත තුළ දැඩිව පැලපදියම් වී තිබුණි. අමන්දි මිය යමින් සිටින්නේ ය යන්න දරා ගැනීමේ හැකියාවක් ඔවුනට තිබේ ද යන්න නිමන්තට සිතා ගත නොහැකි ය. සත්‍යයේ කටුක බව සියළු සිත් පීඩාවට පත් කරමින් තිබෙන බව ඔහුට වැටහෙයි.

ආයුර්වේද හන්දියේ තදබදයට වාහනය නැවැත්තූ මොහොතේ ඔහු හිස හරවා බිරිඳ දෙස බැලුවේ ය. ඇය අපහසුවෙන් සිටින්නාක් මෙන් ඔහුට පෙනුණි.

"ඔයාට මොනා හරි බොන්න ඕනෙ ද..?" ඔහු ඇසුවේ වාහනය පාර අද්දරින් නවත්වන අතර ය. ඈ නිහඬව ම එකඟතාව පළ කළා ය. ඔහු පාර අද්දර තැඹිලි වෙළෙන්දාගෙන් තැඹිලි ගෙඩියක් කප්පවා ඇයට දුන්නේ ය. ඇගේ මුහුණ සුදුමැලි වී තිබෙනු ඔහු දුටුවේ ය.

"වේදනාවද..?" ඔහු ඇසුවේ අනුකම්පාවෙනි. ඇය කිසිවක් නොකියා තැඹිලි වතුර බීවා ය. " ඔයාට මහන්සි නම් අපි ටිකක් ඉඳලා යමු.."

ඈ පිළිතුරක් දෙන්නට නොවෙහෙසී අත් බෑගයෙන් ගත් බෙහෙත් පෙත්තක් කටට දමා ගත්තා ය. ඔහු රියදුරු අසුනේ වාඩි වී ඈ දෙස බලා සිටියේ ය.

"අපි යමු..." ටික වේලාවකට පසු ඕ කීවාය.

"නුගේගොඩින් මොනා හරි අරන් යමු.." ඔහු කීවද ඈ පිළිතුරක් නොදුන්නා ය. ඔහු සුපිරි වෙළඳ සල බිමේ වාහනය නවත්වා බැස යන විටත් බඩු මලු කීපයක් ගෙනැවිත් වාහනයේ පිටුපස අසුන මතට දමන විටත් නැවත

**"..අඬන්න එපා... හිනා-වෙලා ඉන්න.. එතකොට මගේ හිත හදාගන්න ලේසියි.. ඔයා ඔහොම අඬනකොට මගේ හිත කඩා වැටෙනවා.."**



වාහනය පණ ගන්වා ඉදිරියට යන විටත් ඕ නිහඬව හැඟීම් විරහිතව බලා සිටියා ය. ඈ නැවත කටහඬ අවදි කළේ ජුබිලි කණුව හන්දියෙන් වාහනය හරවන අතර දී ය.

"අම්මලාට වැඩි දෙයක් කියන්න එපා... කලබල වෙයි.. දුක හිතෙයි.."

ඔහු කිසිවක් නොකීවේ ය. එය ඇගේ කැමැත්ත නම් එයට ඉඩ දිය යුතු ය..

"එක්කො මම ඇත්තම කියනවා.. බොරුවට මිනිස්සුන්ගේ හිත් වල බලාපොරොත්තු ඇති කරන්නෙ මොකට ද..?" ඇය කීවේ වාහනය නිවස ඉදිරියේ නවත්වන අතර ය.

ඔහු වාහනයෙන් නොබැස ඇය දෙස බලා සිටියේ ඇගේ තීරණය නිවැරදිව දැන ගනු සඳහා ය. ඈ ඒ බව වටහා ගත්තා ය.

"අනේ මන්දා.. මට තේරෙන්නෙ නැහැ... මගේ ඔලුව අවුල් වෙලා.." වාහනයේ දොර අරින අතර ඇය කීවා ය.

තාත්තා මිදුලට වී බලා සිටියි. ඔහුගේ මුහුණ බලා කතාකරන්නට නොහැකි තරමට හිත අවුල් වී ඇත.

"එන්න පුතා එන්න.." තාත්තා නිමන්තට අසුනක් පෙන්වයි. තමන් දැකීමෙන් ඔහු බොහෝ සතුටට පත්ව සිටින බව අමන්දිට පෙනෙයි. මේ සතුට කොයි තරම් තාවකාලික වන්නේ ද යන්න සිහිපත් වන විට ඇගේ සිත හඬා වැටෙයි.

"මොකද දූ මූණත් එක්ක මැළවිලා..?" අම්මා ඇසුවේ ඉවෙන් යමක් වටහා ගත්තාක් මෙනි. කිසිදු ආකාරයක සිත් කැළඹීමක් මවගෙන් වසන් කළ නොහැකි බව අමන්දා දනියි.

කිසිදු අමුත්තක් නොපෙන්වා සිටින්නට අමන්දි උත්සාහ ගත්තා ය.

"ඇයි දුව.. අසනීපයක්වත්ද..? අද ඔයාගෙ මූණ හරි නෑ.." අම්මා නැවත අසයි. අමන්දි අම්මාගේ උරහිසට හිස ඔබා ගත්තා ය.

"මගේ ඔලුව ටිකක් රිදෙනවා අම්මා.." ඈ මිමිණුවා ය.

"ඉන්න මම තෙල් ටිකක් දාන්න.." අම්මා ගෙතුළට යන්නට සැරසුණා ය.

"එපා..." අමන්දි කීවා ය. අම්මාගේ උරහිස මත දැනෙන සුවය තවත් වේලාවක් විඳ ගන්නට ඇයට ඇවැසිව තිබුණි.

"හුරතල් වෙන්න හදනවා නේද..?" තාත්තා සිනාසුණේ ය.

"මේ.. මේ.. දැන් ඔයාට ඕවා අයිති නැහැ හොඳේ.. දැන් අම්මා එක්ක හුරතල් වෙන්න අවසර තියෙන්නෙ මට විතරයි..." චතුරි සිය අක්කා අවුස්සාගන්නට තැත් කළා ය. ".. ඔයාට ඉතින් හුරතල් වෙන්න කෙනෙක් ඉන්නවනේ.." ඇය අමන්දිගේ කණට ළංවී කීවේ මවට නෑසෙන්නට ය.

අමන්දි සිනා සී නැඟනියගේ කණින් ඇද්දා ය.

"..එන්න අක්කෙ, අපි යමු ඇතුළට.." චතුරි අමන්දිගේ අත අල්ලා ගනිමින් "..අයියේ මොනවද බොන්නේ.. තේ එකක් බොමුද.. නැත්නම් තැඹිලි..?" යි ඇසුවාය.

"මුකුත් එපා නංගි.. අපි එන ගමන් තැඹිලි බිව්වා.." නිමන්ත කීවේ ය. කිසිවක් කෑමේ බීමේ අවශ්‍යතාවක් ඔහු සිතට නොඑයි. සිත බොහෝ සේ කැළඹී ඇති නිසාවෙන් විය යුතු ය. ඔහුගේ සිතේ කැළඹීම තාත්තා වටහා ගන්නට ඇත.

"පුතා.. මොකක් හරි කරදරයක් ද?" තාත්තා නිමන්තට පමණක් ඇසෙන සේ පහත් හඬින් ඇසුවේ ය. නිමන්ත යමක් කියා ගත නොහැකිව බොහෝ වේලාවක් බලා සිටියේ ය. ඔහුගේ දෑස් තුළ කඳුළු පිරී ඇති බවක් තාත්තා දුටුවේ ය. නිමන්ත ඔහුට ඇසින් සන් කරමින් නැගිට්ටේ ය. තාත්තා නිමන්ත පසු පසින් මිදුලට බැස්සේ ය.

00000000000

චතුරි සිය අක්කා දෙස බලා සිටියේ විමතිය පිරුණ දෑසින් ය.

"අනේ අක්කා ඇත්ත කියන්න.. ඔයා මය විහිලුවක් නේද කරන්නෙ..?" ඇය ඇසුවේ අමන්දිගේ දෙඋරින් අල්ලාගන්වන ම ය. අක්කාගේ දෑසේ රැඳී තිබූ බැල්ම ඇගේ සිතේ ගිනිය තවත් වැඩි කළේ ය.

"කියන්න... ඔයා බොරුවක් නේද මේ කරන්නේ..? අනේ ඇයි අපිව මෙහෙම බය කරන්නේ..?" ඈ නැවත ඇසුවා ය.

"අම්මාට කියන්න එපා.." අමන්දි කීවා ය.

චතුරි අක්කාගේ ළමැදට හිස තබා ගත්තා ය. ඇය ඉකිබිඳිද්දී අමන්දි ඇය තව තවත් තුරුලු කරගත්තා ය.

"අනේ අක්කා ඔය කතාව බොරුවක් කියලා කියන්න..."

අමන්දි දිග සුසුමක් හෙළුවා ය. ඒ සුසුම ගිනි සුළඟක් සේ චතුරිට දැනුණි.

"ජීවිතේ කියන්නෙ කොහේදෝ තැනක ලියලා තියෙන විදිහට සිද්ධ වෙන දෙයක් නංගි.. අපට ඒකට විරුද්ධව කරන්න කිසිම දෙයක් නැහැ... මම හිත හදාගෙන ඉන්නේ.. එන විදිහකට මුහුණ දෙන්න මං ලෑස්තියි.. " අමන්දා වචන එකින් එක ගලපා ගනිමින් කීවා ය.

"ඒත්..."

"ඒත් කියන වචනෙට ඉඩක් නෑ නංගි... සියල්ල දෙවියටට ඉඩ දීලා බලා ඉන්නවා ඇරෙන්න මට කරන්න වෙන දෙයක් නැහැ... යන්න වුණොත් යන්න මං ලෑස්ති වෙනවා.. ඔයාලා දාලා යන්න වෙන එක දුක තමයි.. ඒත් මං මේ සියලු බැඳීම් වලින් ඈත් වෙන්න උත්සාහ කරනවා..." අමන්දි මහත් සෙනෙහසකින් නැගනිය ගේ හිස පිරිමැද්දා ය. "..අඬන්න එපා... හිනාවෙලා ඉන්න.. එතකොට මගේ හිත හදාගන්න ලේසියි.. ඔයා ඔහොම අඬනකොට මගේ හිත කඩා වැටෙනවා.."

චතුරි එය නෑසුණා සේ අක්කා ගේ ළමැදේ හිස හොවා ගත්වන ම මහ හඬින් හඬන්නට පටන් ගත්තා ය. කාමරයට එපිටින් අම්මා ඉකිගසන හඬ ද අමන්දිට ඒ අතරේ ඇසුණි.

ළඹන කළාපයට



ජගත් ජේ එදිරිසිංහ ලියයි



ජනක රත්නායක අඳියි

